**ශීර්ෂ 110 - අධිකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂ | දෙපාර්තමේන්තුව |
|---|---|
| 228 | අධිකරණ පරිපාලනය |
| 231 | ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව |
| 233 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව |
| 234 | ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් |
| 235 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් අධිකරණ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව පහත සදහන් දිනවල එම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරිට හා ගණන්දීමේ නිලධාරින් වෙත නිකුත් කරන ලදි. ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| ------ | -------------------------------- | ----------------------------- |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | 2015 ජුලි 27 |
| 228 | අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව | 2015 අගෝස්තු 13 |
| 231 | ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව | 2015 ජුනි 26 |
| 233 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 2015 ජුලි 10 |
| 234 | ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 2015 අගෝස්තු 13 |
| 235 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 2015 ජුලි 03 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම**

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 05 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.6,310,348,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.5,966,340,291 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.1,951,727 ත් රු.171,338,607 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3.36 ත් සියයට 25.16 ත් අතර පරාසයක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 110 | 753.34 | 647.46 | 105.88 | 14.05 |
| 228 | 5,102.45 | 4,931.11 | 171.34 | 3.36 |
| 231 | 10.97 | 9.02 | 1.95 | 17.78 |
| 233 | 301.48 | 261.85 | 39.63 | 13.15 |
| 234 | 126.41 | 105.15 | 21.26 | 16.82 |
| 235 | 15.70 | 11.75 | 3.95 | 25.16 |
| **එකතුව** | **6,310.35** | **5,966.34** | **344.01** | **5.45** |

## 2.2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 05 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු. මිලියන |
| 11001 | 10.00 | 9.98 | 5.50 | 7.49 | 52.00 | 36.07 |
| 22801 | 290.42 | 290.18 | 175.00 | 205.39 | 1,100.00 | 772.75 |
| 23101 | 1.00 | 0.85 | 0.20 | 0.35 | 3.50 | 1.59 |
| 23301 | 6.50 | 6.28 | 3.20 | 4.41 | 30.00 | 21.03 |
| 23401 | 13.00 | 10.04 | 5.00 | 8.36 | 45.00 | 31.56 |
| 23501 | 1.20 | 0.87 | 0.20 | 0.39 | 4.50 | 2.39 |

## 2.3. අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 04 ක 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.298,377,307 ක් විය. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ එදිනට අග්‍රිම ගිණුමේ ශේෂයයක් නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| අධිකරණ අමාත්‍යාංශය | 7002/0000/00/0077/0014/000 | 36.775 |
| අධිකරණ පරිපාලනය දෙපාර්තමේන්තුව | 7002/0000/00/0328/0014/000 | 243.987 |
| ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව | 7002/0000/00/0281/0014/000 | 0.383 |
| ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 7002/0000/00/0140/0013/000 | 15.450 |
| නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 7002/0000/00/0320/0014/000 | 1.782 |
| **එකතුව** | | **298.377** |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 03 ක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.7,626,736,470 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| අධිකරණ අමාත්‍යාංශය | 6000/0000/00/0015/0023/000 | 3.727 |
| අධිකරණ පරිපාලනය | 6000/0000/00/0015/0109/000 | 7,532.190 |
| රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0113/000 | 5.207 |
| ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0114/000 | 85.612 |
| **එකතුව** | | **7,626.736** |

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා හා පොත් අනුව අධිකරණ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ජේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන

වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 8 ඡේදය දක්වා වු ඡේදවල දක්වා ඇත.

**3. ශීර්ෂය - 110 අධිකරණ අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) |
| (ආ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

**3.2 ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම**

වැය විෂයයන් 07 ක් සඳහා සළසා තිබුණු රු.27,644,470 ක ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.910,141 ක බැරකම්වලට එළඹ තිබුණි.

3.3 **විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.2,500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 13 ක් සඳහා රු.147,898,204 ක අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 ක සිට සියයට 77 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු.992,574 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 11001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබූ ශේෂවල එකතුව රු.927,648 ක්වූ අතර එම හිඟ හිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3. 6 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණනය වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශයට අයත් අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය, රක්වාන හා නුවරඑළිය සංචාරක බංගලාවල 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2015 ජූලි 09 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.7 අනාර්ථික ගනුදෙනු**

අමාත්‍යාංශය, රාජ්‍ය ආයතනයක් සමඟ 2012 නොවැම්බර් 29 දින ගිවිසුමකට එළඹීමෙන් පසුව ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය සඳහා ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ මහලක් කුලියට ලබා ගෙන තිබුණි. එම මහල වෙනුවෙන් 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට රු.මිලියන 68.9 ක කුලී මුදලක් ගෙවා තිබුණි. එම මධ්‍යස්ථානය 2015 ජුනි මාසයේදී විවෘත කර තිබුණත්, එදින වන විටත් එම මධ්‍යස්ථානයෙන් කිසිදු බේරුම්කරණ කාර්යයක් ඉටු කර නොතිබුණි. 2013 වර්ෂයේ සිට එම ගොඩනැගිල්ලේ මහල කිසිදු කාර්යයක් සඳහා ප්‍රයෝජනයට නොගැනීම නිසා ගෙවා තිබුණු මුළු ගොඩනැගිලි කුලිය නිෂ්ඵල වී තිබුණි.

.

**3.8 කළමනාකරණ දුර්වලතා**

2015 මාර්තු 16 දින හා 2015 ජුනි 23 දින පිළිවෙලින් වත්කම් කළමනාකරණය සම්බන්ධව හා බාහිර පාර්ශවයන්ට දී ඇති වත්කම් සහ අමාත්‍යාංශය ලබාගෙන ඇති වෙනත් පාර්ශවයන් සතු වත්කම් පිළිබඳව විස්තර විගණනයට ඉල්ලා තිබුණත්, 2015 අගෝස්තු මාසය වන විටත් එම තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 35 | 29 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 11 | 09 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 176 | 138 | 38 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 113 | 72 | 41 |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම ) | - | 03 | - |
| | **එකතුව** | **335** | **251** | **87** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 87 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

**4. ශීර්ෂ 228 - අධිකරණ පරිපාලනය**

**4.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාර වාහන සම්බන්ධයෙන් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි.

**4.2 විසර්ජන ගිණුම්**

**4.2.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 12 ක් සඳහා එකතුව රු.876,775, 249 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේදි එකතුව රු.123,065,225 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එම ඉතිරිය වැය විෂයයන්ට සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 6 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) මුලධන වැය විෂයයකට මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව කටයුතු කර වෙනත් වැය විෂයයන්ගෙන් රු.57,800,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.40,700,276 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

**4.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්**

**4.3.1 අග්‍රිම ගිණුම**

1997 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා අධිකරණ අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරයට පියවීමට තිබූණු රු.මිලියන 555 ක අග්‍රිම ශේෂය 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර තිබුණි.

**4.3.2 පොදු තැන්පත්**

සමාලෝචිත වර්ෂයේදී රු.6,840,012,753 ක තැන්පතු ලබා ගෙන තිබූණු අතර, එම තැන්පතු, ලේඛනයට ඇතුළත් කිරීමේදී සංඛ්‍යාවේ නිරවද්‍යතාවය තහවුරු කිරිම සඳහා වගකිව යුතු නිලධාරියෙකු විසින් කෙටිසන් තබා නොතිබුණි.

**4.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

විෂය අංක 22801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පාලන ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.774,769,742 ක් හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.762,701,413 ක් වූයෙන් රු. 12,068,329 ක වෙනසක් පැවැතුණි.

(ආ) සැසඳුම් ප්‍රකාශයේ සඳහන්ව තිබූණු විශ්‍රාම ගිය නිලධාරීන් 91 කගෙන් අයවිය යුතු එකතුව රු.7,288,226 ක් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 හා 4.2.5 වගන්තිවල සඳහන් විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය නිලධාරීන් 85 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.3,913,582 ක ණය ශේෂ මාස 06 ක සිට වර්ෂ 24 දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දින වන විට සේවයෙන් ඉවත් කළ නිලධාරීන් 5 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 81,355 ක ණය ශේෂ සහ වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 103 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.7,922,328 ක ණය ශේෂ මාස 06 ක සිට

වසර 24 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත් එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.5 වත්කම් කළමනාකරණය**

---

දෙපාර්තමේන්තුව සතු එකතුව රු. 231,832,279 ක් වටිනා වාහන සම්බන්ධයෙන් වාහන ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු නිසා වාහන ප්‍රමාණය තහවුරු කර ගැනීමට නොහැකි වූ අතර 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි වාහන සමීක්ෂණයක්ද සිදුකර නොතිබුණි.

**4.6 අනුකූල නොවීම්**

---

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවකුට ගෙවිය යුතු සෑම ගෙවීමකින්ම නිශ්චිත මුදලක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් රඳවා ගත යුතු වුවත්, ඉකුත් වසරවල ආරම්භ කර තිබුණු ඉදිකිරීම් 11 ක් වෙනුවෙන් එකතුව රු.4,210,702 ක් රඳවා ගෙන නොතිබුණි.

**4.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

---

දේශීය මුල්‍යකරණයන් මගින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති පිලිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

---

ඉදිකිරීම් ආරම්භ නොකළ කොන්ත්‍රාත් තුනකට 2012 වර්ෂයේදී රු.2,393,741 ක අත්තිකාරම් ගෙවා තිබුණත්, 2014 දෙසැම්බර් 31 දිනටත් එම අත්තිකාරම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

---

දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.54,198,439 ක් වූ පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබුණි.

| ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධනය | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ අලුත්වැඩියාව- එරාවූර් | 6,322,026 | 2011.12.21 | 1,276,800 | විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| සංචාරකමහේස්ත්‍රාත් අධිකරණ අලුත්වැඩියාව - කලවංචිකුඩි | 6,888,325 | 2012.01. 24 | 2,068,640 | විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| දිසා විනිසුරු නිල නිවස අලුත්වැඩියාව - මාතර | 3,273,948 | සඳහන්ව නැත | 486,080 | විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| මහේස්ත්‍රාත් නිල නිවස අලුත්වැඩියාව - නොච්චියාගම | 13,636,145 | 2013.09.28 | 3,578,400 | විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| හගුරන්කෙත මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 4,372,430 | 1999.12. 07 | 874 ,486 | අනවසර පදිංචිකරුවන් නිසා වැඩ ආරම්භ කිරීමට නොහැකි වීම නිසා කොන්ත්‍රාත් වටිනාකම වැඩිකර දෙන ලෙස 2000 පෙබරවාරි 28 දින කොන්ත්‍රාත්කරු විසින් කළ ඉල්ලීමට අනුව ප්‍රසම්පාදන කමිටුව නව ගිවිසුමකට එළඹීමට යෝජනා කර තිබුණත්, කොන්ත්‍රාත්කරු එය පැහැර හැර තිබුණි. |
| ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 14,987,688 | 2004.09.04 | 2,395 ,801 | කාර්යය ඉටු නොකර අතරමග නවතා තිබුණි. |
| කණුවන මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 20,129,014 | 2010.08.06 | 4,098,999 | කාර්යය ඉටුනොකර අතරමග නවතා තිබුණි. |
| නීති ආධාර හා ප්‍රජාවිශෝධන ගොඩනැගිල්ල ඉදිකිරීම - මාතලේ | 4,690 ,877 | 2007.12.31 | 938,175 | කාර්යය ඉටුනොකර අතරමග නවතා තිබුණි. |

**(ඇ) වගකීම් පැහැරහරින කොන්ත්‍රාත්කරුවන්**

මුදල් රෙගුලාසි 705 හා 1977 ජුනි 06 දිනැති අංක 835 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි වගකීම් පැහැර හරින ලද ඉහත (අ) හා (ආ) හි සඳහන් කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

### 4.8 පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 66 කදී වාහන 55 ක් අනතුරුවලට ලක් වී තිබුණි. එම අනතුරු නිසා සිදු වූ අලාභහානි වෙනුවෙන් රක්ෂණ හිමිකම් ලෙස රු.7,309,520 ක් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ රියදුරන් ප්‍රමාණවත් සැලැකිල්කින් තොරව වාහන ධාවනය කිරිම නිසා සිදු වූ වාහන අනතුරු සංඛ්‍යාව ඉහළ අගයක් ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

### 4.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 15 | 10 |
| (ii) | තෘතියික මට්ටම | 26 | 6 | 20 |
| (iii) | ද්විතියික මට්ටම | 1,008 | 615 | 393 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 3,570 | 2,959 | 611 |
| | **එකතුව** | **4,629** | **3,595** | **1,034** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 1,034 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 5. ශීර්ෂ - 231 ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

### 5.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ/අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

## 5.2 විසර්ජන ගිණුම

### 5.2.1 අයවැය විචලනය

වැය විෂයයන් 14 ක් සඳහා එකතුව රු.9,800,150 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය රු.1,945,037 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 6.41 ක සිට සියයට 97.78 ක් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 5.3 අනුකූල නොවීම

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත දැක්වේ.

2004 ඔක්තෝබර් 18 දිනැති අංක 174 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව එකතුව රු.898,410 ක් වටිනා වත්කම් අදාළ සංකේතාංක අනුව වර්ග කර විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි.

## 5.4 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | - | - |
| (ii) | ද්විතියික මට්ටම | 14 | 07 | 07 | - |
| (iii) | ප්‍රාථමික මට්ටම | 04 | 04 | - | - |
| (iv) | තාවකාලික | - | 02 | - | 02 |
| | **එකතුව** | **19** | **14** | **07** | **02** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 07 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 6. ශීර්ෂ 233 - රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

### 6.1 විසර්ජන ගිණුම්

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් වැය විෂයයකට සළසා තිබුණු රු.200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 3 කට රු.256,828 ක අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ක සිට සියයට 16 ක් දක්වා පරාසයක් ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 6.2 වත්කම් කළමනාකරණය

**නිෂ්ක්‍රීය වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීයව පැවැති කාලය |
|---|---|---|---|---|
| | ---------------- | ------------- | -------------- | ----------------- |
| | | | රු. | |
| (i) | ගොඩනැගිලි (නිල නිවාස) | 2 | විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2013 වර්ෂයේ සිට 2015 අගෝස්තු මාසය දක්වා |
| (ii) | ගෘහ භාණ්ඩ (නිල නිවස) | - | 2,339,521 | - එම - |
| (iii) | ලී අල්මාරි | 17 | විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2012 වර්ෂයේ සිට 2015 අගෝස්තු මාසය දක්වා |

## 6.3 කාර්යසාධනය

2014 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

2014 දෙසැම්බර් 31 දිනට එක් එක් අංශයන්ගෙන් අවසන් නොවී ඉදිරියට ගෙන යන ලද පරීක්ෂණ 4,291 ක් පැවති අතර එයින් අධිකරණ ධූලක විද්‍යා අංශයේ හා අධිකරණ මස්තු විද්‍යා අංශයේ පරීක්ෂණ පිළිවෙලින් 1,302 ක් සහ 1,196 ක් පැවතුණි.

## 6.4 කළමනාකරණ දුර්වලතා

2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව විනාශ කළ යුතු පොත් 307ක්, සංරක්ෂණය කළ යුතු පොත් 1,629 ක්, බැඳිය යුතු පොත් 343 ක් සහ යල් පැන ගිය පොත් 431 ක් හදුනාගෙන තිබුණු අතර 2015 මැයි 15 දින වන විටත් ඒ වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් විගණිත දිනයවූ ගෙන නොතිබුණි.

## 6.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 90 | 73 | 17 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 02 | 8 |
| (iii) | ද්විතියික මට්ටම | 119 | 77 | 42 |
| (iv) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 79 | 51 | 28 |
| | එකතුව | 298 | 203 | 95 |

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 95 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 7. ශීර්ෂ 234 -ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්

### 7.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ/අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ඈ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

**7.2 විසර්ජන ගිණුම්**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 05කට වෙන් කර තිබුණු රු.2,400,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 07 ක් සඳහා රු.4,589,008 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**7.3 පොදු තැන්පත් ගිණුම**

වසර 02 ක් හා වසර 05 ක් ඉක්ම වූ පිළිවෙලින් එකතුව රු.9,251,782 ක හා රු.34,963,472 ක්වූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**7.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

2013 දෙසැම්බර් 31 දිනට විෂය අංක 23401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව පාලන ගිණුම ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව පාලන ගිණුමේ ශේෂය අතර රු.68,245 ක වෙනසක් පැවැතිණු අතර එම වෙනස සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිවැරදි කර නොතිබුණි.

**7.5 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2014 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**7.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වයන් පහත පරිදි විය.

| සේවක සංඛ්‍යාව | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 04 | 01 | - |
| (ii) | තෘතියික හා ද්විතියික මට්ටම | 101 | 62 | 39 | - |
| (iii) | ප්‍රාථමික මට්ටම | 74 | 78 | - | 04 |
| (iv) | වෙනත් (කොන්ත්‍රාත් පදනම ) | - | 01 | - | 01 |
| | **එකතුව** | **180** | **145** | **40** | **05** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 40 ක් සම්පූර්ණ කර නොතිබූණු අතර අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා 05 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ආ) තෘතියික හා ද්විතියික මට්ටමේ අනුමත සේවක සංඛ්‍යාව වෙන වෙනම වර්ග කර නොතිබුණි.

## 8. ශීර්ෂ 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

### 8.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

**8.2 විසර්ජන ගිණුම්**

**අයවැය විචලනය**

වැය විෂයයන් 09 ක් සඳහා රු.3,248,700 ක අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 ක සිට සියයට 93 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**8.3 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය**

**8.3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**8.3.2 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර 2014 වර්ෂයේදී අභ්‍යන්තර විගණන විමසුම් 01 ක් නිකුත් කර තිබුණි.

**8.4 කාර්යසාධනය**

විගණනයට ඉදිරිපත් කළ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් දඬුවම්දීමේ ක්‍රියාමාර්ග පිළිබඳ යෝජිත සංශෝධන කෙටුම්පත පිළියෙල කිරීමේ කටයුතු 2014 ජූලි 02 දින අවසන් කර තිබුණි. එම සැලැස්ම අනුව වැඩසටහන් 17 ක කටයුතු ඉටු කළ යුතුව තිබුණු නමුත් එම කටයුතු 2014 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

**8.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 02 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 15 | 04 | 11 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 07 | 06 | 01 |
| | **එකතුව** | **29** | **13** | **16** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 16 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) මාසිකව රු.35,472 ක වැටුප් ලබන කළමනාකරණ සහකාර උපාධිධාරී නිලධාරිනියක් වසර 04 ක කාලයක සිට කිසිම රාජකාරී පැවරීමකින් තොරව දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය තුල සිටින බව විගණනයට අනාවරණය විය..